# සබරගමුව පළාත් පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය සඳහා පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානයක තිබිය යුතු අත්‍යවශ්‍ය නිර්ණායක

## 01) පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ පිහිටීම

1) මධ්‍යස්ථානයට පහසුවෙන් ඇතුළුවිය හැකිවීම ( කාණු/ඇළ මාර්ග/කම්බි වැටවල් ආදියෙන් තොර වීම)
2) ආරක්ෂිත ස්ථානයක් වීම
3) සෞඛ්‍යට හිතකර පරිසරයක් තිබීම

## 02) ගොඩනැගිලි පහසුකම්

1) ඉගෙනුම හා ක්‍රීඩා සඳහා ප්‍රමාණවත් ඉඩකඩ තිබීම (එක් ළමයකු සඳහා ව.අ.20)
2) ප්‍රමාණවත් ආලෝකය හා වාතාශ්‍රය තිබීම
3) උචිත ගෙබිමක් තිබීම
4) ළමුන්ගේ ඉගෙනුම් උපකරණ ප්‍රමාණාත්මකව හා පහසුවෙන් ලබාගත හැකි පරිදි ගබඩා කර තිබීම
5) ළමුන්ට සුදුසු ජල මුද්‍රිත වැසිකිළි හා ඒ සඳහා ප්‍රමාණවත් ජල පහසුකම් තිබීම

## 03) පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ භාණ්ඩ හා වෙනත් පහසුකම්

1) ළමුන් සඳහා අදාල ප්‍රමිතියට සැකසූ ඩෙස් හා පුටු ප්‍රමාණවත්ව තිබීම
2) නොඑසේ නම් භාවිතා කරන වෙනත් ක්‍රම දරුවන්ට ගැලපීම
3) ගුරු මේස/පුටු තිබීම
4) ළමුන් සඳහා බිත්ති කළු ලෑල්ලක් තිබීම
5) වැලි පිල්ලක් සකස් කර තිබීම
6) ඉගෙනුම්.ඉගැන්වීම් උපකරණ සකසා තිබීම හා ඒවා සුරක්ෂිතව තබා තිබීම
7) ළමා නිර්මාණ ප්‍රදර්ශනය සඳහා සුදුසු ක්‍රමවේද සකස් කර තිබීම
8) සෞඛ්‍ය ආරක්ෂිත ලෙස ජල පහසුකම් තිබීම
9) අත් සේදීම සඳහා පහසුකම් (ජලය,සබන්,අත්පිස්නා) සපයා තිබීම
10) ප්‍රථමාධාර සඳහා අවශ්‍ය බෙහෙත් හා උපකරණ සහිත ප්‍රථමාධාර පෙට්ටියක් තිබීම
11)

## 04) පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ වත්ත

1) සෙවන දෙන ගස් සහිත ප්‍රසන්න වත්තක් තිබීම
2) සෙල්ලම් මිදුල ආරක්ෂා සහිතව තිබීම
3) එය දරුවන්ට පහසුවෙන් ප්‍රයෝජනයට (පරිහරණයට) ගත හැකිවීම
4) යෝජිත අංගෝපාංග තිබීම
   (නැගීමට,පැනීමට,රිංගා යාමට,බැසීමට,පෙරලීමට,පැද්දීමට,සමබර ක්‍රියා/ අංග පහක් වත් තිබිය යුතුය.)
5) වැලි සමග සෙල්ලම් කිරීමට ස්ථානයක් තිබීම
6) ජලය සමග ක්‍රීඩා කිරීම සඳහා පහසුකම් සපයා තිබීම

## 05) පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ පංති කාමර සැකසීම

1) ළමා ඩෙස්පුටු ක්‍රමවත්ව,ළමා ක්‍රියාකාරිත්වයට යෝග්‍ය ලෙස ස්ථානගත කර තිබීම
2) ගුරු සිසු සබඳතාවයට රුකුලක් වන ලෙස සකසා තිබීම
3) බිත්ති කළු ලෑල්ල ළමුන්ට භාවිතා කළ හැකි පරිදි ස්ථානගත කර තිබීම
4) පංති පවිත්‍රතාවය දරුවන්ගේසෞඛ්‍යයට හිතකර ලෙස පැවතීම
5) ආගමික වතාවත් සඳහා සුදුසු ස්ථානයක් තිබීම

## 07) පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ පවත්වාගෙන යායුතු වාර්තා

1) සිසුන් ඇතුලත්වීමේ ලේඛනය
2) ළමුන් පිළිබඳ වාර්තා ගොනුව
3) සිසුන්ගේ පැමිණීමේ ලේඛනය
4) තක්සේරු වාර්තා
5) සෞඛ්‍ය පිළිබඳ වාර්තා
6) ළමුන්ගේ ක්‍රියාකාරකම්වල එකතුවක්
7) ලොග් සටහන් පොත
8) තොග පොත
9) ගුරුවරුන් සඳහා පැමිණීමේ අත්සන් ලේඛනය
10) ගුරු පෞද්ගලික ලිපිගොනුව
11) කාර්තු,වාර්ෂික වැඩ සැලැස්ම
12) දෛනික කටයුතු සැලසුම
13) දරුවන් සඳහා ආහාරපාන සැපයීමට අදාලව ලේඛන
14) දෙමාපියන් හමුවීම පිළිබඳ හා ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තා

## 08) පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ එදිනෙදා වැඩ සැලැස්ම

1) සැලැස්මේ සඳහන් වේලාවට මධ්‍යස්ථානය ආරම්භවීම
2) ආගමික වතාවත් ඉටු කිරීම
3) එළිමහන් ක්‍රීඩා ක්‍රියාකාරකම් සැලසුම
4) විවේක කාල යොදා ගැනීම
5) නියමිත නිර්දේශවලට අදාලව ක්‍රියාකාරකම් සිදුකිරීම
6) සාමූහික ක්‍රියාකාරකම්වලට යොමුකිරීම
7) නිදහස් ක්‍රියාකාරකම්වලට යොමු කිරීම
8) එදිනෙදා සෞඛ්‍ය පුරුදු වලට යොමු කරීම
9) ළමා ඇඳුමෙහි ක්‍රමවත් බව හා පිරිසිදු බව
10) දෙමාපිය සබඳතා සතුටුදායක මට්ටමක පැවතීම
11) මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය සඳහා කමිටුවක් පත්කර තිබීම
12) මෙම වර්ෂය තුල කර ඇති විශේෂ වැඩසටහන්